පේරාදෙණිය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි.
කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය

වෙළුම 5, අංක 2 | 2000 සැප්තැම්බර්-ඔක්තෝම්බර්

# වී වගාවට සින්ක් පොහොර

උසස් ගුණාත්මයෙන් යුතු ප්‍රභේද , නිවැරදි අනුපාතයෙන් එන්.පී.කේ. පොහොර භාවිතය, නිවැරදි ශෂ්‍ය විද්‍යාත්මක ක්‍රම අනුගමනය කලද ශ්‍රී ලංකාවේ වී වගාව සඳහා ඉහල විභවයක් සහිත වියලි හා තෙත් කලාප වල පවා වී අස්වැන්න පසුගිය වසර 15 ක් පුරා එකම මට්ටමක පැවතීම නිරීක්ෂණය වී ඇත.

උසස් අස්වනු සඳහා විභව හැකියාවක් තිබුන ද පාංශු සාරවත්භාවය ප්‍රමාණවත් නොවීම නිසා ශාක වර්ධනය හා ධාන්‍ය අස්වැන්න නිසි පරිදි නොලැබීම මෙයට එක් හේතුවක් විය හැකිය. දිගින් දිගටම වගා කිරීම, පාංශු පාලන ක්‍රම වල දුර්වලතා වී වගා ක්ෂේත්‍ර වල පාංශු තත්වය අඩුවීමට හේතු වී ඇති බව පෙනේ. අඩු නිෂ්පාදන ධාරිතාවයට එක් හේතුවක් ලෙස ක්ෂුද්‍ර පෝෂක ඌනවීම හැඳින්විය හැක. පාංශු පරික්ෂාව මගින් ද මෙම පස් වල ලබාගත හැකි සින්ක් පෝෂක මට්ටම පවතිනුයේ ඌනතා පරාසය (<1.0 ppm) තුළ බව හඳුනාගෙන ඇත.

මේ නිසා පහතරට වියලි කලාපයේ අනුරාධපුර හා පොළොන්නරුව දිස්ත්‍රික්කවල හා පහතරට අන්තර් මාධ්‍ය කලාපයේ කුරුණෑගල දිස්ත්‍රික්කයේත් ලෝ හියුමික් පස් වලට ක්ෂුද්‍ර පෝෂක එකතු කිරීම, වී ශාකයේ වර්ධනය හා අස්වැන්නට බලපෑම අධ්‍යයනය කරන ලදී.

මෙම ප්‍රදේශ වල වී වගා කරන පසට සින්ක් එකතු කිරීම මගින් වී ශාකයේ පටක වල සින්ක් ප්‍රමාණය වැඩි වූ අතර ශාක වර්ධනය හා ධාන්‍ය අස්වැන්න වැඩි විය. පාලකය හා සසඳන විට අස්වනු වැඩිවීම 10-15% ක් වු අතර සමහර අවස්ථා වල දී එය 15% ට වඩා වැඩි විය.

වී වගාව සඳහා සින්ක් ලබාදිය හැකි හොඳම ප්‍රභවය හා ලබා දිය යුතු ප්‍රශස්ත ප්‍රමාණය හඳුනා ගැනීම සඳහා පරීක්ෂණ පවත්වන ලදී.

ප්‍රතිඵල අනුව සින්ක් ඔක්සයිඩ් (ZnO) සහ සින්ක් සල්ෆේට් හයිඩ්‍රේට් ($ZnSO_4$ 7H2O) භාවිතා කල හැකි අතර, සින්ක් සල්ෆේට් හොඳම මූලාශ්‍රය බව පෙනුනි. සින්ක් කි. ග්‍රෑම් 2.5 ක් හෙක්ටයාරයට ලැබෙන සේ එනම් සින්ක් සල්ෆේට් හයිඩ්‍රේට් කි.ග්‍රෑම් 12.5 ක් හෙක්ටයාරයට ලබාදීම වඩාත් සුදුසු බවත් අවශේෂ තැන්පත් තවත් කන්න දෙකක් සඳහා බලපාන බවත් පෙන්නුම් කරන ලදී.

අස්වනු ලබාදීමේ හැකියාව අනුව සින්ක් කි.ග්‍රෑම් 1 ක් හෙක්ටයාරයට (5kg $ZnSO_4$ 7H2O) වන ලෙසට යෙදීම මගින් පාලකය ට වඩා සැලකිය යුතු මට්ටමින් අස්වනු වැඩිවීමක් පෙන්නුම් කල නමුත් එම ප්‍රමාණය යෙදීමෙන් ඊළඟ කන්නයේ වී වගාව සඳහා තැන්පතු වල බලපෑම ලබාගත නොහැකි වේ. මෙය ලබාගත හැකි වන්නේ මූලික පොහොරක් ලෙස හෙක්ටයාරයට සින්ක් සල්ෆේට් හයිඩ්‍රේට් කිලෝ ග්‍රෑම් 12.5 ක් හෙක්ටයාරයට යෙදීමෙනි.

වෙනත් රටවල සින්ක් සල්පේට් යෙදීම නිර්දේශ කර ඇති පොදු ආකාරය වනුයේ මූලික පොහොරක් ලෙස පසට හෝ සමහර අවස්ථා වල වගාවේ මුල් වර්ධක කාලසීමාවේ භාවිතා කිරීමයි. කෙසේ නමුත් ප්‍රමාදවී යෙදීම හොඳ ප්‍රතිඵල පෙන්නුම් නොකරයි.

සින්ක් සල්ෆේට් මූලික පොහොරක් ලෙස පසට යෙදීම නිර්දේශ කරන නමුත් වෙනත් ආකාරයේ සින්ක් යෙදීමේ ක්‍රම භාවිතය ද සැලකිය යුතු බැවින් පහත ආකාර ක්‍රම ද පර්යේෂණය සඳහා භාවිතා කරන ලදී.

- ගොයම් පැළ සිටුවීමට පෙර 2% සින්ක් ඔක්සයිඩ් (හෙක්ටයාරයට සින්ක් ඔක්සයිඩ් කි.ග්‍රෑ. 2) ද්‍රාවණයක මුල් ගිල්ලවීම.
- වර්ග මීටරයට සින්ක් සල්ෆේට් ග්‍රෑම් 5 වන ලෙසට (කි.ග්‍රෑ. 5.0 $ZnSO_4$/ 1000 වර්ග මීටර්) තවාන් පාත්ති වලට සින්ක් සල්ෆේට් යෙදීම. වර්ග මීටර් 1000 කින් හෙක්ටයාරයකට අවශ්‍ය පැළ නිපදවිය හැක.
- සින්ක් ඔක්සයිඩ් කි.ග්‍රෑ. 2 ක් වියලි බීජ කි.ග්‍රෑ. 100 ක් සඳහා වන ලෙසට පැළවූ බීජ වැපිරීමට පෙර සින්ක් ඔක්සයිඩ් වලින් බීජ ප්‍රතිකාර කිරීම.

හෙක්ටයාරයට සින්ක් සල්ෆේට් කි.ග්‍රෑ. 12.5 ක් ලබාදීම මගින් වැඩිම ධාන්‍ය අස්වැන්නක් ලැබුනද ඉහත සඳහන් කල ආකාර භාවිතා කිරීමෙන් ද, සින්ක් භාවිතා නොකල පාලක ප්‍රතිකාරයට සාපේක්ෂව සැලකිය යුතු මට්ටමේ වැඩි අස්වැන්නක් ලබාගත හැකි විය.

නිර්දේශ

1. සින්ක් පොහොර මිළ හා පහතරට අන්තර් මාධ්‍ය හා වියලි කලාපවල ගොවීන්ගේ පිළිගැනීම සලකා බලා හෙක්ටයාරයට සින්ක් කි.ග්‍රෑ. 1.0 - 2.5 (5-12 kg $ZnSO_4 7H_2O$/ha) වන ලෙසට මූලික පොහොරක් ලෙස භාවිතා කල හැකි වේ. මෙහිදී සින්ක් සල්ෆේට් ($ZnSo_4$) යෙදීමට පෙර මූලික පොහොර සමග ඉතා හොඳින් මිශ්‍ර කර පසට මිශ්‍ර කලයුතු වේ.
2. සිටුවීමට පෙර ගොයම් පැළ වල මුල් 2% සින්ක් ඔක්සයිඩ් ද්‍රාවණයක විනාඩි 30-40 ක් ගිල්වා තැබීම.
3. බෝගය පිහිටුවා සති 3-4 කට පසුව ඌනතාවයන් පෙනේ නම් 1% $ZnSO_4$ ද්‍රාවණයක් යෙදීම (හෙක්ටයාරයට ලීටර් 500 ක් වන ලෙසට)
4. වර්ග මීටරයට ග්‍රෑම් 5 ක් වන ලෙසට සින්ක් සල්ෆේට් හයිඩ්‍රේට් තවාන් වලට යෙදීම (5kg $ZnSO_4 7H_2O$/වර්ග මීටර 1000)
5. පැළ වූ බීජ 2% සින්ක් ඔක්සයිඩ් මගින් ආවරණය කිරීම.

සින්ක් ප්‍රමාණය, කොටස් දසලක්ෂයකින් එකකට (ppm 01) වඩා අඩු ඕනෑම පසක් හෝ පස් කිලෝ ග්‍රෑම් 01 ට සින්ක් මි.ග්‍රෑම් 1 (0.05 m HCl extractable) ඇති විට එය සින්ක් ඌන පසක් ලෙස සලකන අතර ඒ සඳහා නිරවද්‍ය කිරීමේ ක්‍රියාමාර්ග භාවිතා කල යුතුය.

*මූලාශ්‍රය : ඩබ්.එම්.ජේ. බණ්ඩාර, පර්.නි. වී පර්. හා සං. මධ්‍යස්ථානය, බතලගොඩ.*

# නිර්දේශිත කොස් ප්‍රභේද

මොරේසියේ කුලයට අයත් කොස් (ආටොකාපස් හෙටරොපිලස්) ශ්‍රී ලාංකීය ජනතාවට ඉතා වැදගත් ශාකයකි. එහි වැදගත්කම නිසාම ව්‍යවහාරයේ එය බත් ගස ලෙසද හඳුන්වයි. කොස් ගසෙහි සියළුම කොටස් ප්‍රයෝජනවත් වන අතර සුළු ගොවීන්ට මෙය ආර්ථිකව වැදගත් භෝගයකි. මුළු පළතුරු බෝග වගා වපසරියෙන් 9% ක් පමණ මෙයට අයත් වේ.

ප්‍රපුංපරිනතිය හා පරපරාගනය වන සහ බීජ මගින් බොහෝවිට ප්‍රචාරණය කරන මෙම ශාක වල විවිධ ප්‍රමාන, හැඩ සහිත ගෙඩි මෙන්ම ඇතුලත මදුළු වල ප්‍රමාණය, වර්ණය හා ගුණාත්මය ද විවිධ වේ. අතීතයේදී මෙය ප්‍රධාන බෝග ශාකයක් නොවූ බැවින් වගාව සඳහා නිර්දේශිත ප්‍රභේද නොවිය. මේ නිසා මෑතකදී ගන්නොරුව උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය මගින් මදුළු ඝනකම සහිත (වරකා ආකාර) ශාක තෝරා ඒ අතුරින් ගුණාත්මයෙන් හා වැඩි නිෂ්පාදන හැකියාවෙන් යුතු, රෝග පලිබෝධ ප්‍රතිරෝධිතාව වැඩි ශාක තේරීම සිදු කරන ලදී. මෙම ශාක ඉදිරි අභිජනන කටයුතු සඳහා ද භාවිතා කළ හැකි වේ.

මෙම පර්යේෂණයේ ප්‍රතිඵලයක් ලෙස කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් වරකා ප්‍රභේද කිහිපයක් වගාව සඳහා නිර්දේශ කරන ලදී. ඒවා පාදර් ලෝන්ග්, මහරගම සහ කොත්මලේ ලෙස හඳුන්වා ඇත.

### පාදර් ලෝන්ග් (Father long)

රවුම්-ඕවලාකාර, මධ්‍යම ප්‍රමාණ ගෙඩි සහිත වේ. ඝනකම මදුළු සහිතය. හැපෙන සුළු භාවයෙන් (crispy), පැණිරස බවින් හා ආකර්ශනීය කහ පැහැයකින් යුතු මදුළු සහිත වේ. බද්ධ පැල අවුරුදු 5 කදී ඵල දරයි.

### මහරගම

දිගු, මධ්‍යම ප්‍රමාණ ගෙඩි සහිත වේ. ඝනකම සහිත මදුළු තැඹිලි පැහැති වන අතර හැපෙන සුළු ස්වභාවය සහිතය. පැණිරස සහිත වේ. බද්ධ පැළ අවුරුදු 5 කදී ඵල දරයි.

### කොත්මලේ

රවුම්-ඕවලකාර මධ්‍යම ප්‍රමාණ ගෙඩි සහිතය. කුඩා මදුළු කහමය තැඹිලි පැහැයට හුරු වේ. පැණිරස ගතියෙන් යුත් අතර හැපෙන සුළු වේ. ආහාරයට ගන්නා කොටස ප්‍රතිශතයක් ලෙස සැලකූවිට වැඩිය. බද්ධ පැළ අවුරුදු 5 කදී ඵල දරයි. ඉදුනු ගෙඩිවල කිරි (කොහොල්ලෑ) ඉතා අඩු ය.

**නිර්දේශිත ප්‍රභේද වල වැඩුනු ශාක වල අස්වැන්න**

| ප්‍රභේදය අවුරුදු | සාමාන්‍ය වයස (අවු) | අවුරුද්දකට ගසකට ලැබෙන ගෙඩි සංඛ්‍යාව |
|---|---|---|
| පාදර්ලෝන්ග් | 50 | 60-100 |
| කොත්මලේ | 18 | 100-150 |
| මහරගම | 50 | 100-150 |

**නිර්දේශිත ප්‍රභේද වල ගෙඩිවල ලක්ෂණ**

| ප්‍රභේදය | ගෙඩියක සාමාන්‍ය බර (කි.ග්‍රෑ.) | ගෙඩියක වටප්‍රමාණයේ සාමාන්‍ය (සෙ.මී.) | ලෙල්ලේ ඝනකම (සෙ.මී.) | මදුළු බර බීජය සමග (කි.ග්‍රෑ.) | මදුළු ප්‍රමාණය සාමාන්‍ය අගය (කි.ග්‍රෑ.) | මදුළු ඝනකම සාමාන්‍ය අගය (සෙ.මී.) | බීජ බර සාමාන්‍ය අගය (කි.ග්‍රෑ.) | ආහාරයට ගන්නා කොටස % |
|---|---|---|---|---|---|---|---|---|
| පාදර්ලෝන්ග් | 12.5 | 35/80 | 2.0 | 6.0 | 75 | 0.8 | 1.8 | 48.0 |
| කොත්මලේ | 10.0 | 26/84 | 1.0 | 5.2 | 216 | 0.5 | 1.5 | 52.0 |
| මහරගම | 15.0 | 45/90 | 2.0 | 8.0 | 130 | 0.7 | 1.5 | 53.3 |

**නිර්දේශිත ප්‍රභේද වල මදුළු වල භෞතික හා රසායනික ලක්ෂණ**

| ප්‍රභේදය | තෙතමනය % | රසය | බික්ස් අගය % | කෙදි % | මදුළු වර්ණය | වෙනත් කරුණු |
|---|---|---|---|---|---|---|
| පාදර්ලෝන් | 75.23 | පැණිරස | 22 | 0.54 | තදකහ | හොඳ රසයක් හා වර්ණයෙන් යුත් ඝනකම සහිත හැපෙන සුළු මදුළු සහිත වේ. |
| කොත්මලේ | 71.0 | පැණිරස | 22.1 | 0.68 | කහතැඹිලි | හොඳ රසයකින් හා වර්ණයෙන් යුතු හැපෙන සුළු මදුළු සහිත වේ. කිරි ගතිය අඩුය. |
| මහරගම | 71.43 | පැණිරස | 25 | 0.50 | කහතැඹිලි | හොඳ රසයකින් හා වර්ණයෙන් යුතුය. ඝනකමෙන් යුතු හැපෙන සුළු මදුළු සහිත වේ. |

*මුලාශ්‍රය : අයි. මැදගොඩ මිය, පර්යේෂණ නිලධාරිනී, උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය, ගන්නොරුව.*

# කෘමිනාශක යෙදීමේ නව ක්‍රමයක්

ඉතා උසට වැඩුනු පළතුරු ගස්වල පළිබෝධ පාලනය ගැටළු සහගත වේ. ශ්‍රී ලංකාවේ පළතුරු ශාක බොහොමයක් ගෙවතු මට්ටමින් ඇති අතර ඒවා අවදානයක් යොමුකර රැකබලා ගැනීම එතරම් සිදුනොවේ. මේ නිසා පළිබෝධ හානියද බහුල වේ. තවද ඒවායේ බහුවාර්ෂික වර්ධක ස්වරූපය නිසාද කෘමීන් ආකර්ශනය වැඩිය. උදාහරණයක් ලෙස අඹ කීඩෑවාගේ හානිය නිසා අස්වනු හානිය 100% ක් වන නමුත් කීඩෑවා පාලනය සඳහා නිර්දේශිත කෘමිනාශක භාවිතය අපහසු කාර්යයක් වී ඇත.

බොහොමයක් පළතුරු ශාක ඉතා උස බැවින් සාමාන්‍ය පළිබෝධ නාශක ඉසීමේ ක්‍රම භාවිතය ප්‍රායෝගික නොවේ. තවද ගෙවතු මට්ටමින් අධි බල ඉසින නොමැති අතර ඒවා කුලියට හෝ ලබාගත හැකි ස්ථාන ද අල්ප වේ. විශාල පරිමාණ අධිබල ඉසින භාවිතය මගින් පාරිසරික ගැටළු වලට මුහුණදීමට සිදුවේ. එනම් පළිබෝධ නාශක විසිරීම හා ඉලක්ක නොකල වෙනත් කෘමීන් විනාශවීම ද සිදුවේ. මේ නිසා වෙනත් ආකාරයකට කෘමිනාශක භාවිතා කිරීම අවශ්‍ය වේ.

කාමිනාශක ශාක කඳට ඉසීම මෙවැනි අවස්ථාවල සාර්ථක ප්‍රතිඵල ලබාදෙන ක්‍රමයකි. මෙහිදී ශාකයේ කඳ පාමුල සිදුරු කර එයට සංස්ථානික කෘමිනාශකයක් යෙදීම කරයි. පරිසර සාධක මගින් සිදුවන බලපෑම ද මෙම ක්‍රමයේදී අවම වේ. කඳට ලබාදුන් කෘමිනාශකය ශාක යුෂය මගින් ශාකය පුරා සංක්‍රමණය වේ.

මෙම ක්‍රමයේදී ඉලක්ක කල කෘමින් පමණක් විනාශ වන අතර ස්වාභාවික සතුරන් විනාශ නොවේ. මේ නිසා පළතුරු ශාක වල ස්වභාවික සමබරතාවයට හානි නොවේ. පළිබෝධ නාශක වෙනත් භාජන වලට ගෙන මිශ්‍ර කිරිමක් සිදුනොවන බැවින් භාවිතා කරන අයට වන හානිද අවම වේ.

මැලේෂියාවේ පාම් (oil palm) ශාක වල පත්‍ර කන දළඹුවන් මර්ධනය සඳහා මෙම ආකාරයට කෘමිනාශක යෙදීම සිදුකරයි. කෘමිනාශක යෙදීමෙන් පසු දේශගුණික සාධක වල බලපෑම නිසා සිදුවන හානිය ද අවම වේ. පාම් ශාක වල පොළොව මට්ටමේ සිට මීටර 1 ක් ඉහලින් අංශක 45 ක ආනතියකට කඳ සිදුරු කරනු ලැබේ. පළල සෙ.මී. 1.5 ක් හා ගැඹුර සෙ.මී. 10-15 වූ සිදුරු සාදනු ලැබේ. සෑම සිදුරකටම කෘමිනාශකය මි.ලී. 15 ක් ඇතුල් කරනු ලැබේ. මේ සඳහා විශේෂිත විදීමේ සිරින්ජයක් භාවිතා කරයි. කාමිනාශක යෙදූ පසු සිදුර මැටි හෝ බිටුමන් යොදා වසනු ලැබේ. අතේ ගෙන යන සිදුරු කිරීමේ උපකරණය හා සිරින්ජය (Injector) භාවිතා කර පුද්ගලයන් දෙදෙනෙකුට දිනකට ගස් 300-500 ක් සඳහා ප්‍රතිකාර කල හැකිය.

ඕස්ට්‍රේලියාවේ චෙම්ජෙට් ට්‍රේඩින් ප්‍රයිවෙට් ලිමිටඩ් මගින් අලිපේර ගස් සඳහා භාවිතා කල හැකි රූපසටහනේ පෙන්වා ඇති සිරින්ජය නිපදවා ඇත. එහි කොටස් ප්ලාස්ටික්. රබර් හා ලෝහ භාවිතා කර සකසා ඇත. එය ප්‍රධාන කොටස් 3 කින් සමන්විත වේ.



කෘමිනාශක යෙදීම සඳහා කඳ සිදුරු කිරීම



තනුක නොකළ කෘමිනාශකය කඳට යෙදීම



කෘමිනාශක යෙදු සිදුර වැසීම




ශාක සඳහා භාවිතා කළ හැකි සරළ සිරින්ජයක්

- ස්කුරුප්පු ආකාර හිස සහිත කෘමිනාශක රඳවා ගන්නා සිලින්ඩරය.
- ලෝහමය ස්ප්‍රින් දඟරය සහිත පීඩනය ලබාදෙන හැඩලය.
  (රබර් වොෂරය මගින් ද්‍රාවනය එලියට එම වළක්වයි.)
- පිටත ආවරණය

ශාක සඳහා භාවිතා කරන සරල සිරින්ජයේ ස්කුරුප්පු හිස කෘමිනාශක අඩංගු බඳුන තුලට ඇතුල්කර පීඩන අත පසු පසට ඇදීමෙන් කෘමිනාශක ද්‍රාවණය සිලින්ඩරය තුලට පිරේ. මෙලෙස පිරුන පසු පීඩන අත අගුළු වැටීම සිදුවන බැවින් සිරින්ජරය තුලින් ද්‍රවණය වැස්සීමක් නොවේ. ගසේ සෙලම කොටස දක්වා සිදුරක් කලපසු ස්කුරුප්පු හිස ආධාරයෙන් සිරින්ජරයේ හිස සිදුර තුලට ඇතුල් කරයි. පීඩන අත තද කිරීම මගින් කෘමිනාශක සිදුර තුලට ඇතුල් කල හැකි අතර ලෝහමය ස්ප්‍රීන් දඟරය නිසා ද්‍රාවණය සෙමෙන් සිදුර තුලට ඇතුලු වේ.

සාම්ප්‍රදායිකව මුළු ප්‍රදේශයටම කෘමිනාශක ඉසීමේ ක්‍රමයට වඩා මෙම ක්‍රමය පැහැදිලිවම වාසිදායක වේ. එමෙන්ම බාවිතා කරන්නා ආරක්ෂා වන අතරම පරිසරයට වන හානියද අවම වේ.

***මූලාශ්‍රයව :** **ආචාර්ය ජී.ඒ.ඩබ්. විජේසේකර සහ ජයන්තා ඉලන්කෝන්, කෘෂි, වෙළුම 16, නො.2-3 සහ** Courier Agrochem, Special issue 2000*

---

## නව කාමරංගා ප්‍රභේදයක් (හනි ස්වීට්)

කැරම්බෝලා හෙවත් ස්ටාර් ෆෘට් (Averrhoa carambola L.) ඔක්සිඩාසියේ කුලයට අයත් වේ. මෙය මැලේෂියාව, ඉන්දුනිසියාව වැනි රටවලට ආවේනික වුවද දැන් ලෝකය පුරා පැතිරී ඇති බෝගයකි. අළුත් පලතුරක් ලෙස පමණක් නොව යුෂ නිෂ්පාදන, අලංකාර කිරීමේ පලතුරක් ලෙස භාවිතය සහ ගුණය ද මෙහි වැදගත්කම කියාපායි.

1984 සහ 1993 වසර වල මැලේෂියාව. ඕස්ට්‍රේලියාව සහ ඇමරිකාව වැනි රටවලින් ප්‍රභේද කිහිපයක් ලංකාවට හඳුන්වා දී එහි යෝග්‍යතාව ඇගයීමකට ලක්කර අස්වැන්න හා ගුණාත්මය අනුව ප්‍රභේද කිහිපයක් තෝරා ගන්නා ලදී.

පරීක්ෂා කල ප්‍රභේද 10 අතුරින් බී 17 ලෙස හැඳින්වූ මැලේෂියාවෙන් ගෙන්වන ලද ප්‍රභේදය දේශිය තත්ව යටතේ හොඳින් වර්ධනය වූ අතර එහි ඵලවල ගුණාත්මක භාවය ද සලකා තෙත් හා අන්තර් මාධ්‍ය කලාප වල වගාව සඳහා නිර්දේශ කරන ලදී. එය හනි ස්විට් (Honey sweet) ලෙස හඳුන්වන ලදී.

**එම ප්‍රභේදයේ ලක්ෂණ**

- බද්ධ පැල වලින් දෙවෙනි වසරේ සිට අස්වනු ලබාගත හැක.

  ගෙඩියක සාමාන්‍ය බර ග්‍රෑම් 130 ක් පමණ වේ.

  ගෙඩියක වටප්‍රමාණය හා දිග පිළිවෙලින් සෙ.මී. 19.5 හා සෙ.මී. 11.75 ක් වේ.

- මධ්‍යස්ථ පළල් දර සහිතය. දරය කෙලවර රවුම්ය. මේ නිසා ප්‍රවාහනයේදී සිදුවන තැලීම් අඩුය.
- ගෙඩි ආකර්ශනීය තැඹිලි කහ පැහැයෙන් යුතු වේ. සෑම ගෙඩියකම බීජ 4 ක් පමණ අඩංගු වේ.
- ගෙඩි වල යුෂ ප්‍රමානය 70 %

| | |
|---|---|
| ගෙඩි වල යුෂ ප්‍රමානය | 70 % |
| බ්‍රික්ස් අගය | 9 % |
| ඔක්සාලික් අම්ලය | 0.3% |
| පී.එච්. අගය | 3.5 |
| ප්‍රෝටීන | 0.52% |
| දළ තන්තු | 0.74% |

මෙම ප්‍රභේදයේ පැණිරසය සහ ඇඹුල් රසය ඉතා හොඳ සමබරතාවයක් සහිතව ඇති බැවින් ඇගයීමේ පරීක්ෂාව මගින් තත්ත්වය හොඳ බව පිළිගෙන ඇත.

අස්වැන්න හෙක්ටයාරයට ටොන් 5-10 කි.

මීටර 5 × 4 පරතරය යටතේ කාමරංගා (කැරම්බෝලා) වගා කලහැකි අතර පේර වගාවට භාවිතා කරන පොහොර නිර්දේශය මෙයට ද භාවිතා කල හැකි වේ.

***මූලාශ්‍රය :** **අයි. මැදගොඩ මිය, පර්යේෂන නිළධාරිණී, උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය, ගන්නෝරුව.***

*සංස්කරණය*
**ජී. වාසුදේවා**

*පරිවර්තනය*
**ජයන්තා ඉලන්කෝන්**

වැඩිදුර තොරතුරු සඳහා විමසන්න : අධ්‍යක්ෂ, ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය, තැ.පෙ. 18, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය.

කෘෂිකර්ම අමාත්‍යාංශයට අයත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය මගින් ප්‍රකාශයට පත් කෙරිනි.

# රා.සේ.පි.

**මුද්‍රිත ද්‍රව්‍යය**

**භාර නොදුනහොත් ආපසු යොමු කරන්න:**

**අධ්‍යක්ෂ,**
**ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය,**
**තැ.පෙ. 18,**
**කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,**
**පේරාදෙණිය.**

මෙම පත්‍රිකාව, පේරාදෙණිය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානයේ පරිගණක අංශයේ පිටු සකස් කර ගන්නෝරුව කෘෂිකර්ම මුද්‍රණාලයේ දී මුද්‍රණය කරන ලදී.